# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2008

### සමාජීය විද්‍යා පීඨය

### ජාත්‍යන්තර අධ්‍යයනය - INTS -E2015

### ජාත්‍යන්තර ආර්ථික කටයුතු

**ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි　　　　කාලය : පැය 03 යි

---

01. ජාත්‍යන්තර වෙළඳාම තුළ කලාපීයකරණය කෙරෙහි යොමුවීමේ ඇති ප්‍රතිවිපාක පිළිබඳ විමසන්න.

02. සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල කරනු ලබන ආයෝජන සඳහා අතරමැදියෙකු ලෙස ක්‍රියාකරමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සංවර්ධනය වෙමින් පවත්නා රටවල් කෙරෙහි දෙබිඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. විමසන්න.

03. ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධවීම තුලින් රටකට නිරපේක්ෂ මෙන්ම සාපේක්ෂ වාසිද ලැබිය හැක. විමසන්න.

04. ආරක්ෂණ වාදය හඳුන්වා තීරු බදුවල විවිධ බලපෑම් පරීක්ෂා කරන්න.

05. ජාතීන් අතර නිෂ්පාදන සහ පරිභෝජන අසමතුලිතතාව ලෝකයේ ආර්ථික සංවර්ධනයට බාධක වී ඇත. සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් ඇසුරින් විමසන්න.

06. වර්තමාන වෙළඳ න්‍යායන් සහ වෙළඳ ස්වභාවය අතර ඇති සම්බන්ධතාව විමසන්න.

07. විදේශ ණය සහ ආධාර ලබාගැනීම නිසා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ඇතිවී තිබෙන ප්‍රතිවිපාක කවරේදැයි විමසන්න.

08. සංචාරක කර්මාන්තය හේතුවෙන් රටකට ලැබෙන වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

09. ඕනෑම <u>හතරකට (04)</u> සටහන් ලියන්න.
    - අ. ජාත්‍යන්තර ප්‍රවාහනය සහ වෙළඳාම
    - ආ. ජාත්‍යන්තර වෙළඳාම තුලින් බිහිවන ප්‍රාග්ධන හුවමාරුව
    - ඇ. නව ගෝලීය වෙළඳාම
    - ඈ. ලෝක වෙළඳ සංවිධානය (WTO)
    - ඉ. ඍජු විදේශ ආයෝජනය
    - ඊ. බහුජාතික සමායතන

*********************